හැටන් දික්ඔය නගර සභාව - 2024
---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

හැටන් දික්ඔය නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට හැටන් දික්ඔය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව හැටන් දික්ඔය නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව පරිහරණය කරන වාහන 05 ක එකතු වටිනාකම රු.446,012 ක් ගිණුම්ගත කර නොතිබුණි.	2025 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයට අදාළව 2025 වර්ෂයේ ගෙවන ලද එකතුව රු. 640,577 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	-එම-	-එම-
(ඇ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු ස්ථිර තැන්පත් පොලී ආදායම රු.520,535 ක් ගිණුම් ගත කර නොතිබුණි.	-එම-	-එම-

1.6.2 නොසැසඳු පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් එවාට අදාළ අනුරූපි වාර්තා ශේෂයන් සමඟ සැසැඳීමේදී රු.17,716,118 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.	උපලේඛන දෝෂ සහිත බවක් පවතින අතර උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් ශේෂ, අදාල උපලේඛන සමඟ සැසදිය යුතුය.

1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විෂයයන් 08 කට අදාළ එකතුව රු. 8,447,271 ක උපලේඛ, ලිපිගොනු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	ලිපිගොනු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් ශේෂයන්ට අදාල ලේඛන, උපලේඛන හා ලිපිගොනු පිළියෙල කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**			
(i)	මු.රෙ 104 (3)	2020 ජනවාරි 28 දින හදිසි ගින්නකින් හානි වූ තානායම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් වසර හතරක කාලයක් ගත වී තිබුණද, පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි.	ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් පරීක්ෂණ කටයුතු මේවන විටත් සිදු කර නොමැති බව.	මුදල් රෙගුලාසි පරිදි ගිනිගැනීමට අදාල පරීක්ෂාවන් සිදු කර සුදුසු පරිදි කටයුතු කළ යුතුය.
(ii)	මු.රෙ 571(3)	2001 වර්ෂයේ සිට 2023 දක්වා කාලයට අදාල කාලය ඉකුත් වූ රු. 7,751,739 ක තැන්පතු 92 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කරන බව.	කාලය ඉකුත් වූ තැන්පතු නිරවුල් කළ යුතුය.
(ආ)	**මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ**			
	1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය	2017 වර්ෂයෙන් පසුව සභාබල ප්‍රදේශයේ වරිපණම් තක්සේරුවක් සිදුකර නොතිබුණි.	තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කළ බව.	වසර 05 කට වරක් දේපළ තක්සේරුව සිදු කර ඒ අනුව වරිපනම් අය කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 95,143,951 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 43,466,570 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	17,644,000	18,161,794	15,757,659	14,945,000	17,944,000	18,230,346	20,894,910	12,540,865
(ii)	කඩ කුලී	55,972,889	60,218,183	26,314,009	94,278,709	29,820,000	17,865,947	17,762,904	60,374,535
(iii)	බලපත්‍ර ගාස්තු	3,800,000	1,908,123	1,908,123	-	3,700,000	875,091	875,091	-
(iv)	වෙනත් ආදායම්	45,428,000	52,975,790	45,545,119	24,182,346	27,578,000	20,259,081	16,371,755	16,751,675
		122,844,889	133,263,890=	89,524,910	133,406,055	79,042,00	57,230,465	55,904,660	89,667,075

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

(අ) ඉකුත් වර්ෂයේ අවසාන දිනට සමස්ත ආදායමේ හිඟය රු. 89,667,075 ක් වී තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එය රු. 133,406,055 ක් ලෙස සියයට 48 කින් හිඟය වර්ධනය වී තිබුණි.මේ අනුව සභාවේ ආදායම් රැස්කිරිමේ කාර්යසාධනය දුර්වල මට්ටමක පැවැතුණි.

(ආ) **වරිපනම් හා බදු**

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වරිපනම් හිඟය රු.14,945,000 ක් විය. ඉන් ඒකකයක් රු.10,000 ට වැඩි ඒකක 344 කින් රු. 6,980,103 ක් නගර සභා ආඥා පනතේ 170 (2) වගන්තිය ප්‍රකාරව කටයුතු කර අයකර නොතිබුණි.	හිඟ අය කර ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව.	හිඟ ආදායම් අයකර ගත යුතුය.

(ඇ) කුලී

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
i.	හැටන් තානායම බදු දීමෙන් 2018 හා 2019 වර්ෂයට අදාළව එකතුව රු.1,581,710 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිටත් අයකර නොතිබුණි.	හිඟ අය කර ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව.	හිඟ ආදායම් අයකර ගත යුතුය.
ii.	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එකතුව රු.88,375,598 ක කඩ කුලී හිඟ ශේෂයක් පැවති අතර ඒ තුළ වසර 01 ත් 05 ත් අතර කඩ හිමියන් 332 කින් රු.87,391,677 ක්ද,වසර 05 ට වැඩි හිඟ ශේෂයක් පවතින කඩ හිමියන් 08 කින් රු.412,974 ක්ද, අයකර නොතිබුණි.	-එම-	-එම-

(ඈ) වෙනත් ආදායම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 4,067,262 ක ඉඩම් බදු හිඟයක් පැවැති අතර ඉන් ඒකකයක් රු.1,000 ට වැඩි හිඟයක් පවතින ඒකක 139 කින් රු. 4,061,494 ක් සම්බන්ධයෙන් නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 170 (1), (2) හා 170 අ (2) ප්‍රකාරව කටයුතු කර අයකර නොතිබුණි.	හිඟ අය කර ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව.	හිඟ ආදායම් අයකර ගත යුතුය.

(ඉ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,053,166 ක් හා මුද්දර ගාස්තු රු.23,129,180 ක් විය.	උපලේඛන ඉදිරිපත් කර ගාස්තු අයකර ගන්නා බව.	හිග මුදල් අයකර ගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
නගර සභාවේ දෛනිකව රැස්කරන කසළ කළමනාකරණය සඳහා ඒකකයක් ස්ථාපිත කර නොතිබීම හේතුවෙන්, මාසිකව එකතුවන දිරන හා නොදිරන කසළ ටොන් 54.5 ක් පමණ ප්‍රමාණයක් කසළ කළමනාකරණ මධ්‍යස්ථාන වෙත ප්‍රවාහනය කිරීම වෙනුවෙන් 2020 සිට 2024 දක්වා රු.12,408,785ක් වැයකර තිබුණි.	කසල කළමනාකරණ මධ්‍යස්ථානයක් ස්ථපිත කිරීම සඳහා සුදුසු ඉඩමක් සභාව වෙත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	ඝන අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය කළ යුතුය.

(ආ) පාරිසරික ගැටළු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
හැටන් බස් නැවතුම්පල මහජන වැසිකිළියේ ගලි වල දීර්ඝ කාලයක සිට උතුරා පිටාර ගලමින් පැවතුණද එය පිලිසකර කිරීමට නගර සභාව කටයුතු කර නොතිබුණි.	පිළිසකර කිරීමට ඇස්තමේන්තුවක් සකස් කරමින් පවතින බව.	මහජන පීඩාවන් ඇති නොවන පරිදි සේවාවන් පවත්වාගෙන යා යුතුය.

3.2 අවිධිමත් ගණුදෙනු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2019 වර්ෂයේදී වර්ග අඩි 34192 කින් යුත් BA/23/2019 දරන වාණිජ ගොඩනැගිල්ලට ආදායම් පරීක්ෂක විසින් තාවකාලික තක්සේරුවක් සිදු කර වාර්ෂිකව රු.718,936 ක වරිපනම් බදු අය කර තිබුණද, 2019 දෙසැම්බර් 31 දින අනුකූලතා සහතිකය නිකුත් කරන ලද වර්ග අඩි 39589 යුත් BA/72/2019 දරන වාණිජ ගොඩනැගිල්ලට තාවකාලික තක්සේරුවක් සිදු කර වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. එබැවින් මෙම වර්ග අඩි 39589 යුත් ගොඩනැගිල්ල සඳහා අවම වශයෙන් වර්ග අඩි 34192 ක් වූ ඉහත වාණිජ ගොඩනැගිල්ලේ වාර්ෂික වරිපනම් වූ රු.718,936 ක අගය වාර්ෂික වරිපනම් ලෙස සලකුවේ නම් පසුගිය වර්ෂ 05 සඳහා අය කර ගත යුතුව තිබුණු රු. 3,594,680 ක වරිපනම් බදු ආදායමක් සභා අරමුදලට අහිමි කර තිබුණි.	නව වරිපණම් තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යවා ඇති බව.	තක්සේරු වාර්තා මත හෝ තාවකාලික තක්සේරු මත ආදායම් අය කළ යුතුය.

(ආ)	ඉකුත් වර්ෂයේ රථ වාහන නැවතුම් ස්ථාන ගාස්තු අය කිරීම ටෙන්ඩර් මඟින් බාහිර පාර්ශවයන් වෙත පවරා වර්ෂය තුල රු. 4,467,865 ක ආදායමක් උපයා තිබුණ ද කළමනාකරණ කමිටු තීරණයකට අනුව සමාලෝචිත වර්ෂයේ සභා සේවකයින් යොදවා රු. 3,373,921 ක රථ වාහන නැවතුම් ගාස්තුවක් පමණක් අය කර තිබුණි. මෙම ආදායම් ඉකුත් වර්ෂයේ ටෙන්ඩර් මඟින් ඉපයූ රථ වාහන නැවතුම් ගාස්තු ආදායම සමඟ සැසදිමේදී සභා අරමුදලට රු. 1,093,944 ක අලාභයක් සිදු වී තිබුණි.	මහජනතාවගෙන් පැමිණිලි ලැබීම හේතුවෙන් සභාව විසින් අදාල ගාස්තු මුදල් අය කිරීමට කටයුතු කළ බව.	සභා අරමුදලට පාඩුවක් නොවන පරිදි තිරණ ගත යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතුව රු. 3,483,279 ක් විය. ඒ තුළ වසර 1 ට වැඩි හා වසර 5 ට අඩු ශේෂය රු. 3,386,245ක් හා වසර 5 ට වැඩි ශේෂය රු. 50,921 ක් විය.	හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව.	ලැබිය යුතු මුදල් අය කර ගත යුතුය.
(ආ)	2023 දෙසැම්බර් 15 දිනැති අංක 2363 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පලකල රථ වාහන නවතා තැබීමේ ගාස්තු උපලේඛනය 04 අනුව බල ප්‍රදේශයේ ලියාපදිංචි ත්‍රී රෝද රථ 338 කින් සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. 1,986,000 ක ත්‍රී රෝද රථ ගාස්තු බිල් කර අය නොකිරීම හේතුවෙන් සභාවට අලාභයක් සිදුකර තිබුණි.	හිඟ මුදල් ගෙවීම පැහැර හරින්නන්ට විරුද්ධව ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	බිල් කළ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව 1987 සිට 2023 දක්වා කාල පරාසයක සිට පවත්නා රු. 4,327,007 ක අත්තිකාරම් 61 ක් පියවා ගැනීමට කටයුතුකර නොතිබුණි.	ඉදිරියේදී පියවා ගැනීමට කටයුතු කරන බව.	අත්තිකාරම පියවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	බදු ලබා දි තිබුණු කඩ කාමර 46 ක බදුකරුවන් සමඟ වසර 06 ත් වසර 26 ත් දක්වා කාලයක සිට ගිවිසුම් කාලය අවසන් වී තිබුණ ද නැවත ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි.	නව ගිවිසුම් අත්සක් කිරීමට කටයුතු කරන බව.	නව ගිවිසුම් වලට එළඹිය යුතුය.

(ඉ)	2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 10 ඡේදයේ විධිවිධාන අනුගමනය නොකර සභාවට අයත් කඩකාමර 28 ක් අතුරුබදු දී තිබුණි.	නව ගිවිසුම් ගත වීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිත බව.	අතුරු බදු දීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඊ)	නගර සීමාව තුළ මාසිකව රු.500 බැගින් අයකර ව්‍යාපාරිකයින් 25 කට පදික වේදිකාව තුල හා බස් නැවතුම්පල පරිශ්‍රය තුල තාවකාලික කඩ කාමර ඉදිකර පවත්වා ගැනීමට දීර්ඝ කාලයක සිට ඉඩ ලබාදීම හේතුවෙන් නගරය අවිධිමත් වී තිබූ අතර මෙවැනි කඩ දෙකක් බස් නැවතුම්පලේ මගීන්ට පිවිසීමට ඇති පඩිපෙල අවහිර කරමින් පවත්වාගෙන යමින් පැවතුණද සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.	නගර සභා ආඥා පනතට අනුව ඉදිරි කටයුතු සිදු කරන බව.	අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් පියවර ගත යුතුය.
(උ)	2020 සැප්තැම්බර් 28 දිනැති මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2020/06 දරන චක්‍රලේඛයේ 2.2 ඡේදය ප්‍රකාරව අතිරික්ත මුදල් සභාවට ආදායම් උත්පාදනය කළ හැකි ආකාරයේ ව්‍යාපෘති, සභා දේපළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති හෝ බහුතර ජනතාවට පොදු පහසුකම් සැපයීමේ ව්‍යාපෘති සඳහා යොදා ගැනීමකින් තොරව සභාව විසින් රු. 32,093,847 ක් අතිරික්ත මුදල් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි.	අනුමැතිය ලබාදී තිබූ ව්‍යාපෘති පමණක් සිදු කළ බව.	අතිරික්ත මුදල් ජනතාවගේ පොදු පහසුකම් සැපයීමට හෝ ප්‍රාදේශීය සංවර්ධනයට යොදා ගත යුතුය.

3.4 නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
එකතු වටිනාකම රු. 2,831,200 ක් වූ වාහන 04 ක් වසර 1ත් 10ත් අතර කාලයක සිට භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතව පැවතුණි.	අළුත්වැඩියා සඳහා යොමු කිරීමට කටයුතු කරන බව.	වත්කම් උපයෝජනය කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.

3.5 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1970 පෙබරවාරි 26 දින නගර සභාව විසින් සින්නක්කර ඔප්පුවක් මගින් මිළට ගෙන තිබූ හැටන් තානායම ඉඩමේ ආරක්ෂාව සඳහා වැට මායිම් යොදා ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	තානායම ඉඩමේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන බව.	සභාව සතු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ගත යුතුය.

(ආ) පවරා නොගත් වාහන

	සභාව පරිහරණය කරන රු. 6,390,000 ක් වූ කැබ් රථයක අයිතිය පවරා ගෙන නොතිබුණි.	පවරා ගැනිමේ කටයුතු සිදුකරමින් පවතින බව.	සභාව සතු වත්කම්වල අයිතිය පවරා ගැනිමට කටයුතු කළ යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ලේකම්, මහජන සෞඛ්‍ය පරීක්ෂක,පවුල් සෞඛ්‍ය සේවා නිළධාරි, සංවර්ධන නිළධාරි, පුස්තකාලාධිපති , කාර්මික නිළධාරි, තාක්ෂණ සහායක,ආදායම් පරීක්ෂක, සෞඛ්‍ය පරිපාලන,රියදුරු,බර වාහන ක්‍රියාකරු, ආයුර්වේද ඖෂධ සංයෝජක, මුරකරු, රථවාහන පාලක, කාර්යාල කාර්ය සහායක , පුස්තකාල සහායක, වැඩ ක්ෂේත්‍ර කම්කරු, සෞඛ්‍ය කම්කරු තනතුරු ඇතුළුව තනතුරු 28 ක පුරප්පාඩු 103 ක් පැවතීම හේතුවෙන් සභාවේ කාර්ය සාධනයට හා මහජන සේවාවන් ඉටු කිරීමේ හැකියාව දුර්වල මට්ටමක පැවතුණි.	පුරප්පාඩු පිළිබඳව දැනුවත් කර ඇති බව.	පුරප්පාඩු සම්පූර්ණ කරවාගෙන මහජන සේවාවන් කාර්යක්ෂමව පවත්වාගෙන යා යුතුය.
(ආ)	නගර සභා බල ප්‍රදේශයේ හදිසි ගිනි ගැනීම් අවස්ථාවකදී අත්‍යාවශයයෙන්ම සිටිය යුතු ගිනි නිවීම් කටයුතුවලට සම්බන්ධ මූලික ගිනිනිවීම්කරු, පළමු පන්තියේ ගිනිනිවීම්කරු, යාන්ත්‍රික ගිනිනිවීම්කරු, ගිනිනිවීම්කරු යන නිලධාරීන් පුරප්පාඩු වීම හේතුවෙන් හදිසි ගිනි ගැනීම් තත්ත්වයකදී ඒවා නිවා දැමීමේ ප්‍රමාදයන් සිදුවිය හැකිව තිබුණි.	-එම-	-එම-
(ඇ)	ස්ථානමාරු වී ගිය, විශ්‍රාම ගිය , මිය ගිය , වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන් පහළොස්දෙනෙකුගෙන් එකතුව රු. 2,123,265 ක ණයශේෂ අය කර නොතිබුණි.	ණය අයකර ගැනීමට කටයුතු කරන බව.	ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.